# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,478 - 2026 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2026.02.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු අ◌ැබැර්තු ... ... | 298 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 310 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 314 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබැර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 20 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු 06 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සැලසුම්) සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සැලසුම්) සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි තනතුරේ නාමය සඳහන් කර **2026.03.06** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 01

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 60ට නොවැඩි විය යුතුය.

3. මාසික දීමනාව : ඔබගේ මාසික දීමනාව රු. 80,000 කි. (අවම දින 21 ක් සේවය කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : විද්‍යාව/ගණිතය/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම;

*හා*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම් : මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම

*හෝ*

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 04 මට්ටම හෝ ඊට ඉහළ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

| | | | |
|---|---|---|---|
| 6. | පළපුරුද්ද | : | අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබිය යුතුය. |
| 7. | විශේෂ සුදුසුකම් | : | මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. |
| 8. | තෝරා ගැනීමේ ක්‍රමය | : | අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ. |
| 9. | කායික සුදුසුකම් | : | අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| 10. | වෙනත් සුදුසුකම් | : | • අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.<br><br>සේවාව ලබා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |

***සටහන :*** මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම සේවාව ලබාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 පෙබරවාරි මස 20 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සැලසුම්) සේවය ලබා ගැනීම**

01. අයදුම්කරු අයත් වන පළාත් පාලන ආයතනය :..........................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :..........................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන් දිනය : වර්ෂය :............ මාසය :............... දිනය :.....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2025.01.06 දිනට) වයස : අවුරුදු :............ මාස :......... දින :............

06. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................

07. විවාහක/අවිවාහක භාවය :..........................................................................

08. ස්ථිර ලිපිනය :……………………………………………………………

09. දුරකථන අංකය :…………………………………………………

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? :………………………………………………

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද ? යන බව :………………………………………………

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය :………………

විභාග අංකය :………………

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය :………………

විභාග අංකය :………………

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු :…………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :………………………………………………………………………

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

…………………………………………………………………………………………………………

13. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

………………………

අයදුම්කරුගේ අත්සන.

දිනය :………………………

02-453/1

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ද්‍රව්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ද්‍රව්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි තනතුරේ නාමය සඳහන් කර **2026.03.06** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 01

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

3. මාසික දීමනාව : ඔබගේ මාසික දීමනාව රු. 75,000 කි. (අවම දින 21 ක් සේවය කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ රසායන විද්‍යාව පිළිබඳ රසායනාගාර තාක්ෂණවේදය ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අධිකාරී සාමාජිකත්වය (L.I. Chem.C ලබා තිබීම;

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාව/රසායන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් රසායන විද්‍යාව/රසායනාගාර විද්‍යාව පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

6. පළපුරුද්ද : වෘත්තියට අදාළ සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

7. විශේෂ සුදුසුකම් : මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

9. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

10. වෙනත් සුදුසුකම් : • අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

සේවාව ලබා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :** මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම සේවා ලබා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 පෙබරවාරි මස 20 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ද්‍රව්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පී සේවය ලබා ගැනීම**

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය :.........................................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :..........................................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. උපන් දිනය : වර්ෂය :............ මාසය :............... දිනය :.....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.03.06 දිනට) වයස : අවුරුදු :............ මාස :......... දින :............

06. ස්ත්‍රී/පුරුෂ භාවය :.......................................................................

07. විවාහක/අවිවාහක භාවය :.......................................................................

08. ස්ථිර ලිපිනය :.................................................................

09. දුරකථන අංකය :...........................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? :...........................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද ? යන බව :...........................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය :………………

විභාග අංකය :………………

| *අනු. අංකය* | *විෂයය* | *ලබා ඇති ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය :………………

විභාග අංකය :………………

| *අනු. අංකය* | *විෂයය* | *ලබා ඇති ශ්‍රේණිය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු :……………………………………………………………………………………

……………………………………………………………………………………………………………

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :……………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

13. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත් කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දනිමි.

………………………

අයදුම්කරුගේ අත්සන.

දිනය :………………………

02-453/2

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තරතුරු පුරප්පාඩු පිරවීම

1. විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. පුරප්පාඩු පවතින තනතුරු :

| *අනු අංකය* | *තනතුරු* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | රියදුරු | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |

**3. උක්ත තනතුර සඳහා අවශ්‍ය පොදු සුදුසුකම් :**

1.1. *අධ්‍යාපන සුදුසුකම්.*.- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයන් 05 ක් එක් වසරකදී සමත් වී තිබිය යුතුයි.

1.2. *කායික සුදුසුකම්* .- සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර බල ප්‍රදේශයේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

1.3. වෙනත් :

(i) අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් - එය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45ත් අතර විය යුතුය. ( අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ)

**රියදුරු තනතුර සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම් :**

(v) රියදුරු සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය - ( D කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් විය යුතුය.

(vi) එය අවුරුදු 03 කට පෙර ලබාගත් එකක් විය යුතුය.

(vii) ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

(viii) පෙර සේවය කර ඇත්නම් එම ආයතන මගින් ලබාගත් සහතික

***සටහන* .-** පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :**

3.1. බඳවා ගන්නා ප්‍රතිශතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

3.2. *බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩුවලට පත් කරනු ලැබේ.

3.3. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* .- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය (100%)* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. ඉහළම ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 70 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

(පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගැනීමේ දී අදාළ පළාත් පාලන ආයතනයේ දැනට සේවයේ නියුතු අය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දිය හැක)

**4. වෙනත් පොදු සුදුසුකම් :**

4.1. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

4.2. රජයේ/ පළාත් පාලන/ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙක් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුවකු නොවිය යුතුය.

**5. ආයදුම්පත් ඉදිරිපත් කිරීම:**

5.1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කර ගන්නා ලද අයදුම් පත් 2026.03.15 වැනි දිනට පෙර " ලේකම්, ප්‍රාදේශීය සභාව, විල්ගමුව" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5.2. අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

5.3. අයදුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සාමදාන විනිශ්චකාරවරයකු/ග්‍රාම නිලධාරියකු/ මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

5.4. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

- උප්පැන්න සහතිකය;
- අධ්‍යාපන සහතිකය;
- ජාතික හැඳුනුම්පත;
- පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය;
- මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් (ඉන් 01ක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය);
- වෘත්තීය සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කරන සහතික;
- සේවා සහතිකය.

5.5. අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුවේ.

***සැලකිය යුතුයි :***

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතුය.

ආර්. ඩබ්. ඩබ්.සුදර්ශනී,
ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි 20 දින,
විල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :.................................................................................................................

02. ස්ථිර ලිපිනය : ...............................................................................................................

03. උපන් දිනය :....................................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................................................

05. තනතුර : ..........................................................................................................................

06. දුරකථන අංකය : .............................................................................................................

07. ස්ත්‍රී / පුරුෂ භාවය : ........................................................................................................

08. අධ්‍යාපන සුදුසුකම් :

★ අ.පො.ස. (සා.පෙළ) විභාගය:-

පළමු වර :

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

දෙවන වර :

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

★ අ.පො.ස. ( උ. පෙළ) විභාගය :

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

09. වෙනත් සුදුසුකම් :- ..........................................................................................................................

**10. අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරැදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වනබවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

..............................
අයදුම්කරුගේ අත්සන

දිනය:.........................................

**11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................... (ලිපිනය) හි පදිංචි ................................... (නම) යන අය මම පෞද්ගලික ව හඳුනන බවත්, ඔහු/ ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

...........................................
සහතික කරන්නාගේ අත්සන
නිල මුද්‍රාව තබන්න)

දිනය:.........................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම:.......................................................
තනතුර:.......................................
ලිපිනය:.......................................

**12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.**

මෙම ඉල්ලුම්කරුවන් .......................... (නම) යන අය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .......................... (තනතුර ) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

........................................
අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:......................................

02-502

**හක්මණ ප්‍රාදේශීය සභාව**

හක්මණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුරු නාමය | - | රියදුරු (දෛනික පදනම) |
| තනතුරු සංඛ්‍යාව | - | 01 |
| රැකියාවේ ස්වභාවය | - | 2026.12.31 දින දක්වා පමණක් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවය ලබා ගනු ලැබේ. ඉන් ඔබ්බට සේවය දීර්ඝ කරනු නොලැබේ. |
| වැටුප් කේතය | - | PL 3 - 2025 |

01. **බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :**

1.1 දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත් වීම

1.2 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රය හා නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම

02. **වයස් සීමාව** : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

03. **බඳවා ගැනීමේ පොදු කොන්දේසි :**

3.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක කාල සීමාව (අනුගාමී වසර 03 ක්) දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

3.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

3.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

3.5 සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීනතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

04. **සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :**

4.1 සේවා අවශ්‍යතාව අනුව හක්මණ ප්‍රාදේශීය සභාව සතු කැබ්රථ, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, ජල බවුසර්, ගලි බවුසර්, ටිපර් රථ කම්පැක්ටර් ආදී රථ වාහනවල රාජකාරි සඳහා යොදවනු ලැබේ.

05. **අයදුම්කළ යුතු ආකාරය :**

5.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2026.03.13 දිනට පෙර සභාපති, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5.2 අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රියදුරු තනතුර සඳහා" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.3 අසම්පූර්ණ, අපැහැදිලි අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයදුම්පත සමඟ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික හා නිපුණතා සහතික,
3. පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය;
4. ජාතික හැඳුනුම්පත;
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්;

06. අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය සංශෝධනය කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

ආර්. එම්. ඩබ්. සෙනෙවිරත්න,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 18 දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හක්මණ ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර සඳහා දෛනික පදනම මත බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :..........................................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :..........................................................................................
3. පෞද්ගලික ලිපිනය :..........................................................................................
4. උපන් දිනය අවුරුද්ද :.................. මාසය :.................. දිනය :....................
5. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................
6. විවාහක/අවිවාහක බව :..........................................................................................
7. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................
8. දුරකථන අංකය :..........................................................................................
9. දිස්ත්‍රික්කය :..........................................................................................
10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................................
11. සමත්ව ඇති ඉහළම විභාගය :..........................................................................................
12. ශිල්පීය නිපුණතා :..........................................................................................
13. වෘත්තීය සුදුසුකම් :..........................................................................................
14. ඔබට උසාවියෙන් දඬුවම් පවරා තිබේද? :..........................................................................................
15. එසේ නම් දඬුවමේ ස්වභාවය :..........................................................................................

..........................................................................................................................

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

02-431

# පළාත් පාලන නිවේදන

## මීගමුව මහා නගර සභාව

2026 පරිපූරක අයවැය ඇස්තමේන්තුව අංක 01

මීගමුව මහා නගර සභාවේ 2026 වර්ෂයේ මාර්තු මස ඉදිරිපත් කළ යුතු 2026 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ඇස්තමේන්තුව 2026.02.27 දින සිට 2026.03.05 දින දක්වා දින 07 ක් මහජන පරීක්ෂාව සඳහා නාගරික ගණකාධිකාරි දෙපාර්තමේන්තුවේ තබා ඇති බව 1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 214 (ආ) වගන්තිය යටතේ දැනුම් දෙමි.

එච්. එම්. ඩී. රොබට් හීන්කෙන්ද,
නගරාධිපති,

මහා නගර සභාව,
මීගමුව.

02-509

---

## පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව

තීරණ අංක 224

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 129 වගන්තියේ උපවගන්තියේ 2(ඉ), 134 වගන්ති යටතේ පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර වෙම්පියන්පත්තු සහ කුඩත්තනය උපකාර්යාලයට අදාළ ප්‍රදේශය තුළ පිහිටා ඇති නිවාස සඳහා, ගොඩනැගිලි, ඉඩම්, කුඩා ගෙවල් සඳහා පැවරී ඇති බලතල ප්‍රකාර එම දේපළ මත වරිපනම් සඳහා වාර්ෂික වටිනාකමින් සියයට දහයක් බැගින් (10%) වාර්ෂික දේපළ බද්දක් අය කිරීමට 2026.01.28 දිනැති අංක 224 දරන යෝජනාව මෙයින් කරමි.

උදයකුමාර් යුහදීස්,
සභාපති,
පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.

පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව,
පුලෝලි.
2026 ජනවාරි මස 28 දින.

02-506

---

## මහව ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති ස්ථානයෙහි ගෝ ඝාතකාගාර ආඥාපනත යටතේ එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝසාතක ආඥාපනතේ 272 අධිකාරයේ 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. එම්. පී. ආර්. සුමේද කුමාර හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2026 වර්ෂයේ පෙබරවාරි මස 10 දින,
මහව ප්‍රාදේශීය සභාව,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *සාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාලසීමාව* |
|---|---|---|---|
| 01 | ආර්. එම්. රුසයිදු | 276/6, කණුව, අනුරාධපුර පාර, අඹන්පොල | 2026.03.13 සිට 2026.12.31 දක්වා |

02-450

---

**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**

2026 සඳහා ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් වූ ගෝසාතක බලපත්‍ර නිකුත් කිරීමට අදාළව ගෝසාතක ආඥාපනත 7(2) උපවගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් ඉල්ලුම්කරු විසින් පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුරූපීව සඳහන් ලිපිනය ඇති ස්ථානවල එහි විස්තරකර ඇති ස්වභාවයේ ගවමස් වෙළඳසැල් පවත්වාගෙන යාම සඳහා ගෝසාතක බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම්කර ඇති බව නිවේදනය කරමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් විරෝධතාවයක් පවතින්නේ නම් ඒ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් (දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව 2026 පෙබරවාරි මස 10 දින තීරණ අංක ඉ (01) 02 යටතේ මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. නිමල් හේරත්,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 10 දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01 | ඒ. එච්. ඒ. එච්. හෆිල්දීන් මයා | අංක 50, දොරගමුව පාර | එළ ගවමස් වෙළඳසැල |

02-411/1

---

**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ගෝ සාතකාගාරයක් හෝ එළු සාතකාගාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත් 272 අධිකාරිය 7(2) උපවගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයේ 2026 වර්ෂයට ගෝ සාතකාගාරයක් හෝ එළු සාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙනද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දා සිට දින 14 ක් (දාහතරක්) ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව 2026 පෙබරවාරි මස 10 දින තීරණ අංක ඉ (01) 01 යටතේ මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. නිමල් හේරත්,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2026 පෙබරවාරි මස 10 දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ස්වභාවය* | *ගෝසාතකාගාරය හා එළු සාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* |
|---|---|---|---|
| 01 | කේ. එම්. තයියුබ් | ගෝසාතකාගාරය | 38/1/බී, ඌරාදෙණිය, ගුන්නැපාන |

02-411/2

---

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු.ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. ඊ. ජී. අසිත රණවීර,
සභාපති,
උඩුනුවර ප්‍රොද්ශීය සභාව.

**ලියාපදිංචි කළ යුතු මාර්ගය**

**මිනින්දෝරු සැලැස්ම සහිතව**


| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම් පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | අංක - 38 ගෙලිඔය | ජය මාවත | ගෙලිඔය බුවැලිකඩ මාර්ගය | කේලමදෙණිය වත්ත | 1. එස්. ජී. එස්. පී. බණ්ඩාර<br>2. එච්. ජී. එස්. රත්නකුමාර<br>3. එම්. එදිරිවික්‍රමසූරිය<br>4. කේ. එම්. කේ. බණ්ඩාර | 1. එච්. එල්. සී. පියනන්දන<br>2. එන්. එස්. දසනායක<br>3. ඩබ්ලිව්. එල්. කේ. පිටවල<br>4. එම්. ඒ. ඩී. ආර්. ගුණරත්න<br>5. එම්. ඒ. ඩී. රෝශිණී ගුණරත්න | මීටර් 134 | අඩි 10 |

ජී. ඊ. ජී. අසිත රණවීර,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

දුරකතන අංකය : 071-8184892/081-2310275
ෆැක්ස් අංකය : 081-2311309
විද්‍යුත් තැපැල : udunuwaraps@gmail.com

C.S.LIYANAGE(M.S.I)
Registered Licensed Surveyor
Court Commissioner & Valuer
No.40, Isuru Pedesa,
Malkaduwawa,
Kurunagala.
Reg. No. 19700573

**PLAN No: 13379**




**Reference**

| | |
|---|---|
| St | - Stake |
| EP | - Electric Post |
| CP | - Cement Post |
| M | - Mark |
| B | - Bank |
| TP | - Telephone Post |
| BW | - Boundary Wall |
| RW | - Retaining Wall |
| GP | - Gate Post |
| LF | - Live Fence |
| WF | - Wire Fence |
| WNF | - Wire Net Fence |
| Road(RDA) | - Road(Road Development Authority) |

Scale 1 : 500

# PLAN

OF

## JAYA MAWATHA
Situated at
G.N.Division No. 38, Gelioya
Dehipagoda Village
Within the Pradeshiya Sabha Limits of Udunuwara
in Ganga Palatha Korale of Udunuwara D.S.Division
KANDY DISTRICT – CENTRAL PROVINCE

මුල් පිටපත හා සැසඳෙන බවට සහතික කරමි.

Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.0466 | 0 | 0 | 18.42 | Road (10ft Road with 1 Feet Drain) |
| Total | 0.0466 | 0 | 0 | 18.42 | |

Length of "A" to "B" = 92m (302 Feet)
Length of "C" to "D" = 42m (138 Feet)

1) Survey as the Request of Owners of Land in Both side of Road
2) Boundaries pointed out by owners of the Land in both side of Road.
3) 'Jaya Mawatha' for Register in Udunuwara Pradeshiya Sabha

Surveyed on 31st of August 2025.

02 – 457

02-457

සංශෝධනයයි

**මීගමුව මහා නගර සභාව**

2025.11.28 දින ගැසට් අංක 2,465 හා නිවේදන අංක 11-448 න් පළ වූ නිවේදනය පහත පරිදි සංශෝධනය කෙරේ.

**2026 අයවැය ඇස්තමේන්තුව**

මීගමුව මහා නගර සභාවේ 2025 වර්ෂයේ දෙසැම්බර් මස ඉදිරිපත් කළ යුතු 2026 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව 2025.11.28 දින සිට 2025.12.04 දින දක්වා දික 07 ක් මහජන පරීක්ෂාව සඳහා නාගරික ගණකාධිකාරි දෙපාර්තමේන්තුවේ තබා ඇති බව 1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 212(ආ) වගන්තිය යටතේ දැනුම් දෙමි.

එච්. එම්. ඩී. රොබට් හීන්කෙන්ද,
නගරාධිපති,
මහා නගර සභාව,
මීගමුව.

02 - 508

---

# විවිධ දැන්වීම්

**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව**

2026 වර්ෂය සඳහා දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ පොළ ගාස්තු පැනවීම

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් 2026 වර්ෂයේ පෙබරවාරි මස 03 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 07(XI) 42 (XXI) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

කේ. ඩී. පැරකුම් ශාන්ත,
නගරාධිපති.

2026 පෙබරවාරි මස 03 දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

මහා නගර සභා ආඥාපනතේ 155 වගන්තිය හා උක්ත වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 267 වගන්තිය ප්‍රකාරව වෙළඳ පොළවල් සහ ඉස්තාල, කරත්ත, ගවයින් ආදිය තබා ගැනීම සඳහා, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ සාදනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන ප්‍රකාර රත්මලාන පොදු වෙළඳ පොළෙහි සහ අනෙකුත් ටෙන්ඩර් නොකර සභාව විසින් ගාස්තු අය කරනු ලබන පොළවල් සඳහා වෙළඳාම් කිරීමේ දී පහත සඳහන් පරිදි දෛනික ගාස්තු පැනවීමටත්, එම පැනවූ ගාස්තු අය කිරීම, 2026.02.03 දින සිට පනවා අය කිරීමටත්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව විසින් යෝජනා කරන්නීය.

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ - 2026 වර්ෂය සඳහා කරගම්පිටිය සහ ගල්කිස්ස පොළ ගාස්තු අය කිරීම (5' x 5') ප්‍රමාණයේ බිම් කොටසක් සඳහා).

| | *විස්තරය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| 1. | සාප්පු අයිතම/ විසිතුරු භාණ්ඩ වෙළඳාම් කිරීම | 200.00 |
| 2 | මාළු වර්ග/කරවල වර්ග විකිණීම | 400.00 |
| 3 | එළවළු පමණක් විකිණීම | 200.00 |
| 4 | පලතුරු පමණක් විකිණීම | 200.00 |
| 5 | පලාවර්ග පමණක් විකිණීම | 100.00 |
| 6 | සිල්ලර බඩු සමග එළවළු/පළතුරු/පලාවර්ග විකිණීම | 200.00 |
| 7 | ලොරි රථ සඳහා | 1,000.00 |

02-444

**වැල්වෙට්ටිතුරෙයි නගර සභාව**

ආදායම් අය කිරීම - 2026 වර්ෂය

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 255 පරිච්ඡේදයේ වගන්ති ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් වැල්වෙට්ටිතුරෙයි නගර සභාවේ යෝජනා අංක D8/SM3/2025.11.06 අනුව නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පහත සඳහන් ආදායම් අය කිරීම් මෙම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්වෙට්ටිතුරෙයි නගර සභාවට අයිති/හිමි ආදායම් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. කේ. සිවාජිලිංකම් මහතා,
සභාපති,
වැල්වෙට්ටිතුරෙයි නගර සභාව.

2026 ජනවාරි මස 09 වැනි දින,
වැල්වෙට්ටිතුරෙයි නගර සභාව ,
වැල්වෙට්ටිතුරෙයි.

**දේපළ බද්ද පැනවීම - 2026**

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 පරිච්ඡේදය) වගන්ති 166 - 172 යටතේ වැල්වෙට්ටිතුරෙයි නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රදේශය තුළ පිහිටා ඇති නිවාස, ගොඩනැගිලි, ඉඩම්, කුඩා ගෙවල් ආදිය සඳහා හිමි කරගත් බලතල ප්‍රකාරව එම දේපළ මත ඇස්තමේන්තුව අදාළ වාර්ෂික වටිනාකමෙන් සියයට ප්‍රතිශත හය (6%) වාර්ෂික ආදායම් බදු අය කළ යුතුයි.

තවද, 2026 වර්ෂයේ පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති සෑම කාර්තුවකටම අදාළව නිශ්චිතව දක්වා ඇති දිනට පෙර වාර්ෂික ඇස්තමේන්තු බද්ද වැල්වෙට්ටිත්තුරෙයි නගර සභා අරමුදලට ගෙවිය යුතු බවත්, වර්ෂයේ කාර්තු හතරට අදාළ බදු ප්‍රතිශතය 2026.01.30 දිනට පෙර ගෙවීම් කරන්නේ නම් සියයට දහයක ප්‍රතිශත (10%) වට්ටම්ද මෙම උපලේඛනයේ සඳහන් කර ඇති සෑම කාර්තු සඳහා ඉදිරියේ තුන්වන තීරුවේ සඳහන් කර ඇති දිනට පෙර අදාළ බදු ප්‍රමාණය වැල්වෙට්ටිතුරෙයි නගර සභා අරමුදලට ගෙවීම් කළොත් එක් කාර්තුවට අදාළ ප්‍රමාණයේ සියයට පහක ප්‍රතිශත (5%) වට්ටම් ද වැල්වෙට්ටිතුරෙයි නගර සභාව විසින් ලබා දෙන බවත් නියමිත කාර්තුව තුළ බදු මුදල් ගෙවීම් කර නොමැති විට ඒ සඳහා මුඩු බිම්, පදිංචි ඉඩම් සඳහා ප්‍රතිශත පහළොවක් ද (15%) වෙළඳ ස්ථාන සඳහා ප්‍රතිශතය සියයට විස්සක්ද (20%) දඩ මුදල් වශයෙන් අය කරන බවත් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

**උපලේඛන - I**

| වාරිකය | ගෙවිය යුතු දිනය | 5% වට්ටම් සඳහා නියමිත අවසන් දිනය |
|---|---|---|
| පළමු කාර්තුව | 2026.03.31 ට පෙර | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 ට පෙර | 2026.04.30 |
| තුන්වන කාර්තුව | 2026.09.30 ට පෙර | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 ට පෙර | 2026.10.31 |

---

**වැල්වෙට්ටිතුරෙයි නගර සභාව**

වෙළඳ බලපත්‍ර - 2026

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 පරිච්ඡේදය) අංක 184 අ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ අංක 162, 164, 165අ සහ 153(2) යන වගන්තිය මගින් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්වෙට්ටිතුරෙයි නගර සභා ප්‍රදේශය තුළ මෙම උපලේඛනයෙ I තීරුවේ සඳහන් කර ඇති කිසියම් ව්‍යාපාරයක් 2026 වර්ෂයේ කරගෙන යාම සඳහා නිකුත් කරන වෙළඳ බලපත්‍ර සඳහා එම ව්‍යාපාරය කරන ස්ථානයේ වාර්ෂික වටිනාකම II තීරුවේ සඳහන් කර ඇති විෂය කරුණුවල සීමාවන්ට යටත් වන අවස්ථාවේ ඊට කෙළින් උපලේඛනයේ සඳහන් කර ඇති ගාස්තු පනවා 2026.03.31 දිනට පෙර ගෙවීම් කළ යුතු බව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

## උපලේඛන - II

### ආහාර, බීම මෙහෙයවීම හා අනතුරු, පිළිකුල ඇති කරන ව්‍යාපාර සඳහා බලපත්‍ර

| අංකය | ව්‍යාපාරයේ හෝ වෘත්තියේ විස්තර | වාර්ෂික වටිනාකම රු. 750.00ට වැඩි නොවන<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු.750.00සිට රු. 1,500.00 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1500.00 ට වැඩි<br>රු. ශත |
|---|---|---|---|---|
| 1. | තේ/කෝපි කඩය | 500.00 | 750.00 | 1,000.00 |
| 2. | පාන්/පෝරණුව පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 3. | කෑම ශාලාව | 500.00 | 750.00 | 1,000.00 |
| 4. | ආහාර හා ලැගුම් පහසුකම් සහිත නිවාස | 500.00 | 750.00 | 1,000.00 |
| 5. | මුද්‍රණාලය පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 6. | ලී මඩුව පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 7. | විශාල යන්ත්‍ර සහිත ලී මඩුව පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 8. | ලියවන පට්ටල වැඩපොළ | 500.00 | 750.00 | 1,000.00 |
| 9. | ඇඹරුම් හල් | 500.00 | 750.00 | 1,000.00 |
| 10. | හාල් මෝල් ලොකු | 500.00 | 750.00 | 1,000.00 |
| 11. | කොණ්ඩෙ අලංකාර කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 12. | පාපැදි අලුත්වැඩියා කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 13. | රථ වාහන අලුත්වැඩියා කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 14. | පෙට්‍රෝලියම් භාණ්ඩ පිරවුම් හල | 500.00 | 750.00 | 1,000.00 |
| 15. | භූමිතෙල් අලෙවි කරන ස්ථානය | 500.00 | 750.00 | 1,000.00 |
| 16. | පෙට්‍රෝලියම් භාණ්ඩ පිරවුම්හළ | 500.00 | 750.00 | 1,000.00 |
| 17. | විදුලි වැඩපොළ | 500.00 | 750.00 | 1,000.00 |
| 18. | කන්ණාඩි විකුණන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 19. | පොහොර, කෘමි නාශක විකුණන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 20. | කුකුළන් පනහට වැඩියෙන් ඇති කුකුල් පට්ටිය | 500.00 | 750.00 | 1,000.00 |
| 21. | අයිස් කැට කම්හල | 500.00 | 750.00 | 1,000.00 |
| 22. | ඡායාරූප ශාලා | 500.00 | 750.00 | 1,000.00 |
| 23. | අයිස් වාඩිය | 500.00 | 750.00 | 1,000.00 |
| 24. | මාළු පදම් කිරීමේ ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 25. | කකුළු, ඉස්සන් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 26. | දුම්කොළ බුලත් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 27. | කිරි ගොවිපල | 500.00 | 750.00 | 1,000.00 |
| 28. | ඉස්සන් මිලදී ගැනීමේ ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 29. | පාන් පෝරණුව හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 30. | පාන් පෝරණුව හා තේ කඩ | 500.00 | 750.00 | 1,000.00 |
| 31. | ඇලුමිනියම් තහඩු සවිකරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |

| අංකය | ව්‍යාපාරයේ හෝ වෘත්තියේ විස්තර | වාර්ෂික වටිනාකම රු. 750.00ට වැඩි නොවන රු. ශත | වාර්ෂික වටිනාකම රු.750.00සිට රු. 1,500.00 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1500.00 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 32. | සිමෙන්ති අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 33. | සතුන් මස් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 34. | අයිස් ක්‍රීම් අයිස් පලම් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 35. | කුකුළන් විකුණන කඩ | 500.00 | 750.00 | 1,000.00 |
| 36. | පළතුරු, පළතුරු වර්ග අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 37. | එළවළු අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 38. | කරවල අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 39. | ගුවන් විදුලි, රූපවාහිනී අලුත්වැඩියා කිරීමේ ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 40. | මත්පැන් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 41 | පීර් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 42. | ආයුර්වේද බෙහෙත් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 43. | සිසිල් බීම අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 44. | රසකැවිලි වර්ග නිෂ්පාදන කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 45. | පොල් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 46. | රථ වාහන සර්විස් කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 47. | පුද්ගලික කර්මාන්ත ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 48. | බෙහෙත් වර්ග අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 49. | ආභරණ නිෂ්පාදන කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 50. | තීන්ත ඉසින ස්ථානය | 500.00 | 750.00 | 1,000.00 |
| 51. | මුද්‍රණාල | 500.00 | 750.00 | 1,000.00 |
| 52. | මිරිස් කුඩු හා කුළු බඩු කුඩු ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 53. | කෑම පිසින භාණ්ඩ කුලියට දෙන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 54. | පුද්ගලික බෙහෙත් ශාලාව | 500.00 | 750.00 | 1,000.00 |
| 55. | පුද්ගලික රෝහල | 500.00 | 750.00 | 1,000.00 |
| 56. | දන්ත වෛද්‍ය ශාලාව | 500.00 | 750.00 | 1,000.00 |
| 57. | හාල් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 58. | ගෑස් සිලින්ඩර් අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 59. | කුකුල් කෑම අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 60. | අලෙවි කිරීම සඳහා පොහොර එකතු කර තැබීම | 500.00 | 750.00 | 1,000.00 |
| 61. | ත්‍රී රෝද වාහන අලුත්වැඩියා කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 62. | මිට්ටායි,කඩල, ටොපි අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 63. | තොග වෙළඳ ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 64. | නවාතැන් පහසුකම් සහිත ලැගුම් හල් | 500.00 | 750.00 | 1,000.00 |
| 65. | පිටතින් සවි කරන මෝටර් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 66. | බේරාගත් භාණ්ඩ අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |

| අංකය | ව්‍යාපාරයේ හෝ වෘත්තියේ විස්තර | වාර්ෂික වටිනාකම රු. 750.00ට වැඩි නොවන රු. ශත | වාර්ෂික වටිනාකම රු.750.00සිට රු. 1,500.00 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1500.00 ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 67. | ගුවන් විදුලි , රූපවාහිනී, ඔරලෝසු අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 68. | මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 69. | වී කඩයක් | 500.00 | 750.00 | 1,000.00 |
| 70. | බුලත් කඩ | 500.00 | 750.00 | 1,000.00 |
| 71. | ලෝහ වර්ග පෑස්සීම | 500.00 | 750.00 | 1,000.00 |
| 72. | සත්ව රෝහලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 73. | මාළු, මස් ජාඩි දැමීම හෝ වියලම හෝ අයිස් දැමීම | 500.00 | 750.00 | 1,000.00 |
| 74. | කළ පිරිසිදු කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 75. | රටකජු අලෙවි කරන ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |

---

## වැල්වෙට්ටිතුරෙයි නගර සභාව

### වෙළඳ බද්ද - 2026 වර්ෂය

